## ශීර්ෂය 210 - රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව

-----------------------------------------------------

### 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2019 මැයි 31 දින ගණකාධිකාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2019 මැයි 30 දින ගණකාධිකාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2018 දෙසැම්බර් 31 දිනට රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණකාධිකාරීගේ හා ගණකාධිකාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ප්‍රධාන ගණකාධිකාරීගේ හා ගණකාධිකාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වාගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී හා ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

-----------------------------------------------------------

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක අවප්‍රකාශයන්ගෙන් තොර බවට තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇති විය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ආර්ථික තීරණ ගැනීමේදී ඒ පිළිබඳව සැලැකිලිමත් විය යුතුය.

වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. මා විසින්,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කිරීමෙන් වංචා සහ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මඟ හරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කිරීම පිණිස දෙපාර්තමේන්තුවේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමේදී, මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව,

මාගේ විගණනයෙන් හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දූර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

-------------------------------------------------------

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණ මා ප්‍රකාශ කරමි.

(අ) දෙපාර්තමේන්තුව විසින් ඉකුත් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ අවශ්‍යතාවය නොතිබුණු බැවින් සමාලෝචිත වර්ෂයේදී ඉදිරිපත් කර ඇති මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවලට අනුරූපී බව ප්‍රකාශ කළ නොහැකි විය.

(ආ) රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව විසින් ඉකුත් වර්ෂයට අදාළව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ අවශ්‍යතාවයක් නොතිබුණු බැවින් ඉකුත් වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ නිර්දේශ ඉදිරිපත් කර නොතිබුණි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

**(අ) දේපළ, පිරියත හා උපකරණ**

දේපළ, පිරියත හා උපකරණ සම්බන්ධයෙන් පහත සඳහන් අඩුපාඩු අනාවරණය විය.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2017 දෙසැම්බර් 31 දිනට දෙපාර්තමේන්තුව සතුව තිබූ රු.105,651,859 ක් වටිනා ගෘහභාණ්ඩ, කාර්යාල උපකරණ හා යන්ත්‍ර හා උපකරණ සමාලෝචිත වර්ෂයේ මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයට ඇතුළත් කර නොතිබුණි. | 2018 නොවැම්බර් 21 දිනැති අංක 267/2018 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛයේ විධිවිධාන ප්‍රකාර දෙපාර්තමේන්තුවේ සියලු වත්කම් ගිණුම්ගත කළ යුතුව ඇත. | 2017.12.31 දක්වා මිලදී ගැනීම් සිදුකළ භාණ්ඩ, ගිණුම් වාර්තා අනුව සිගාස් වැඩසටහනට ඇතුළත් කළද එම භාණ්ඩ ලේබල් කිරීම සඳහා වෙන් වෙන්ව හඳුනාගැනීමට අපහසු වූ නිසා 2018.12.21 දින රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුවේ දී පැවති ස්ථාවර වත්කම් සම්බන්ධ රැස්වීමේදී අප දෙපාර්තමේන්තුවේ සිගාස් වැඩසටහනේ ඇතුළත් කර තිබූ වත්කම්වල අගයන් ඉවත්කරන ලද අතර වෙන් වෙන්ව හඳුනාගත හැකි වත්කම්වල අගයන් පමණක් නැවත සිගාස් වැඩසටහනට ඇතුළත් කිරීමට තීරණය විය. 2018 මූල්‍ය ප්‍රකාශන සඳහා 2018 වර්ෂය තුළදී මිලදී ගත් කාර්යාල උපකරණ හා යන්ත්‍රෝපකරණ පමණක් ඇතුළත් කරන ලදී. |

| | | |
|---|---|---|
| | | අදාළ ගැලපීම ACA 6 හි සටහනක් මගින් පැහැදිලි කර ඇත. |

**(ආ) ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම**

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| **හානි පිළිබඳ ලේඛනය** | | |
| 2017 වර්ෂයේදී සිදු වූ වාහන අනතුරු 03 කට අදාළව හානියේ වටිනාකම, අලුත්වැඩියා කිරීමට යන මුදල, අයකරගත හැකි වටිනාකම යනාදී විස්තර හානි පිළිබඳ ලේඛනයේ ඇතුළත් කර නොතිබුණි. ඒ අනුව දෙපාර්තමේන්තුවේ හානි හා පාඩු ලේඛනය යාවත්කාලීන කර පවත්වා නොතිබුණ බව නිරීක්ෂණය විය. | මු.රෙ.110 ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ හානි පිළිබඳ ලේඛනය යාවත්කාලීන කර පවත්වා ගත යුතුව ඇත. | අදාළ සියලු විස්තර ඇතුළත් කර හානි හා පාඩු ලේඛනය යාවත්කාලීන කිරීමේ කටයුතු සිදු කෙරෙමින් පවතී. |

**(ඇ) ප්‍රධාන ගණන්දීමේ නිලධාරී හා ගණන්දීමේ නිලධාරී විසින් සිදුකළ යුතු සහතිකවීම්**

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වන වගන්තියේ විධිවිධාන අනුව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී හා ගණන්දීමේ නිලධාරී විසින් පහත සඳහන් කරුණු සම්බන්ධයෙන් සහතික වීම් කළ යුතුව තිබුණත්, ඒ අනුව කටයුතු කර නොතිබුණි.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (i) | රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වාගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී හා ගණන්දීමේ නිලධාරී | 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුවීම. | දෙපාර්තමේන්තුවේ අභ්‍යන්තර පාලන ක්‍රමවේදයන්හි පවත්නා අඩුපාඩු වරින්වර නිරීක්ෂණය කර ඒවා විධිමත් කිරීමට කටයුතු කර ඇත. තවද අංශ ප්‍රධානී රැස්වීමේ හා විගණන |

| | | | |
|---|---|---|---|
| | සහතික විය යුතු අතර, එම පද්ධතියේ සඵලදායීතාවය පිළිබඳව කලින් කල සමාලෝචනය ලිඛිතව සිදුකර එහි පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුව තිබුණත්, එවැනි සමාලෝචනයන් සිදුකළ බවට ප්‍රකාශ විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | | කළමනාකරණ කමිටුවේදී අභ්‍යන්තර පාලනයේ පවත්නා අඩුපාඩුවලට අවශ්‍ය පිළියම් යෙදීමට කටයුතු කර ඇත. |
| (ii) | අභ්‍යන්තර විගණන කර්තව්‍ය නිසි පරිදි ක්‍රියාත්මක කිරීම සඳහා ඵලදායී ක්‍රමවේදයක් ඇති බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී හා ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු වුවත්, වාර්තාවේ 4.1 ඡේදයේ සඳහන් නිරීක්ෂණ අනුව එම අවශ්‍යතාවය ඉටුකර නොතිබුණි. | 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුවීම. | දැනට පුරප්පාඩුව පවතින අභ්‍යන්තර විගණක තනතුරට නිලධාරියෙකු පත් කරන මෙන් දන්වා ඇතත් මෙතෙක් පත්කිරීම් බලධාරියා විසින් පත්කිරීම් සිදු කර නැත. |

**(ඇ) නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම**

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| | **විගණන නිරීක්ෂණය** | | **නිර්දේශය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** |
|---|---|---|---|---|
| | **නීති,රීති හා රෙගුලාසිවලට යොමුව** | **අනුකූල නොවීම** | | |
| (i) | 2018 අංක19 දරන ජාතික විගණන පනතේ 16(2) වගන්තිය | 2018 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සමඟ වාර්ෂික කාර්යසාධන වාර්තාව ඉදිරිපත් කර නොතිබුණි. | 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(2) වගන්තිය ප්‍රකාරව කටයුතු කළ යුතුව ඇත. | නිරීක්ෂණ නිවැරදිය |
| (ii) | 2016 මාර්තු 31 දිනැති අංක 05/2016 දරන රාජ්‍ය මුදල් | 2017 වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණ වාර්තාව මාස 06 ක ප්‍රමාදයකින් පසුව | 2018 නොවැම්බර් 21 දිනැති අංක 267/2018 දරන රාජ්‍ය ගිණුම් | විවිධ අපහසුතා හේතුවෙන් භාණ්ඩ සමීක්ෂණ ක්‍රියාවලිය අවසන් |

| | | | |
|---|---|---|---|
| චක්‍රලේඛය | 2018 දෙසැම්බර් 27 දින විගණනයට ඉදිරිපත් කර තිබුණි. | චක්‍රලේඛයේ ඇති විධිවිධාන අනුව වාර්ෂික මූල්‍ය ප්‍රකාශනවලට වත්කම් ඇතුළත් කිරීමට පෙර වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය කළ යුතුව ඇත. | කිරීමට කල්ගත විය. 2018 වසරේදී නීතිරීති හා රෙගුලාසි ප්‍රකාරව භාණ්ඩ සමීක්ෂණ කටයුතු අවසන් කර භාණ්ඩ සමීක්ෂණ වාර්තාව ඉදිරිපත් කරන බව දන්වමි. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 වියදම් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | වැය විෂයයන් 03 ක් සඳහා සළසා තිබුණු එකතුව රු.මිලියන 51.50 ක ප්‍රතිපාදන උපයෝජනය නොකිරීම නිසා එම ප්‍රතිපාදනය මුළුමනින් ඉතිරි කර තිබුණි. | මුදල් රෙගුලාසි 50 ප්‍රකාරව නිවැරදි වියදම් ඇස්තමේන්තු පිළියෙල කළ යුතු වීම. | නැවත මිල කැඳවීම් කිරීමට සිදුවීම හා ප්‍රසම්පාදන ලියවිලි සකස් කරගැනීමට අපේක්ෂා කළ කාලයට වඩා වැඩි කාලයක් ගතවීම, ශුද්ධ ප්‍රතිපාදනය සම්පූර්ණයෙන්ම ඉතිරිවීමට හේතුවිය. |
| (ආ) | වැය විෂයයන් 05 ක් සඳහා අධිප්‍රතිපාදන සැලසීම නිසා එම ප්‍රතිපාදනයන් උපයෝජනය කළ පසු ඉතිරිය සලසා තිබුණු ප්‍රතිපාදනයෙන් සියයට 21 ක සිට සියයට 82 ක් දක්වා පරාසයක ප්‍රමාණයක් වී තිබුණි. | මුදල් රෙගුලාසි 50 ප්‍රකාරව නිවැරදි වියදම් ඇස්තමේන්තු පිළියෙල කළ යුතු වීම. | කාර්යයන් වෙනත් ආයතන මඟින් ඉටුකිරීම, දේශපාලන වාතාවරණය, මධ්‍යම මට්ටමේ මාණ්ඩලික නිලධාරීන් නොමැති වීම, බිල්පත් ඉදිරිපත් නොවීම, ව්‍යාපෘති සංශෝධනය කිරීම, භාණ්ඩාගාරයෙන් අක්මුදල් නොලැබීම, භාණ්ඩ නියමිත දිනට සැපයීමට අපොහොසත් වීම වැනි හේතු නිසා ප්‍රතිපාදන සියයට 21 සිට සියයට 82 දක්වා ඉතිරි විය |

**2.2 බැරකම් හා බැදීම්වලට එළඹීම**

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | මුදල් රෙගුලාසි 94(1) ප්‍රකාරව සලසා තිබුණු ප්‍රතිපාදනය ඉක්මවා බැරකම්වලට එළඹීම නොකළ යුතු වුවත්, වැය විෂයයන් 03 ක් සඳහා සලසා තිබුණ ප්‍රතිපාදනය උපයෝජනයන් කළ පසු ඉතිරිවීම් රු.427,441 කින් ඉක්මවා රු.453,775 ක බැරකම්වලට එළඹ තිබුණි. | 2017 අප්‍රේල් 27 දිනැති අංක 255/2017 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛයේ විධිවිධානවලට අනුකූලව කටයුතු කළ යුතුය. | සමස්ථ ප්‍රතිපාදනය ඉක්මවා නොයන පරිදි බැරකම් කළමනාකරණය කර තිබෙන අතර, 2018 වර්ෂය තුළදී බැරකම්වලට නොගෙවන බැවින් ප්‍රතිපාදන මාරුකර ගැනීමට කටයුතු කර නැත. |
| (ආ) | දෙපාර්තමේන්තුව විසින් රාජ්‍ය ආයතන 02 කට ගෙවිය යුතුව තිබුණු රු.948,750 ක් 2019 මැයි 02 දින වන විටත් නිරවුල් කර නොතිබුණි. | 2017 අප්‍රේල් 27 දිනැති අංක 255/2017 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛයේ විධිවිධානවලට අනුකූලව කටයුතු කළ යුතුය. | රාජ්‍ය මුද්‍රණ දෙපාර්තමේන්තුවේ රු.925,750 ක බිල්පත් හා රාජ්‍ය වාණිජ නීතිගත සංස්ථාවේ රු.23,000 ක බිල්පත් මේ වන තෙක් ගෙවීමට ඉදිරිපත් වී නොමැත. |
| (ඇ) | ඉකුත් වර්ෂය අවසානයට වූ රු.මිලියන 33.00 ක බැරකම්වලින් සමාලෝචිත වර්ෂයේදී රු.මිලියන 20.87 ක බැරකම් නිරවුල් කර තිබුණි. ඒ අනුව සමාලෝචිත වර්ෂය අවසාන වන විට රු.මිලියන 12.13 ක බැරකම් ප්‍රමාණයක් පැවතුණි. මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කර තිබුණු බැරකම් පිළිබඳ ප්‍රකාශනයේ හා බැරකම් ලේඛනයේ එම බැරකම් ප්‍රමාණය සටහන් කර නොතිබුණි. | මුදල් රෙගුලාසි 211(1), 214 හා 447(4) ප්‍රකාරව කටයුතු කර සියලු බැරකම් මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කරනු ලබන බැරකම් පිළිබඳ ප්‍රකාශනයේ සඳහන් කළ යුතුය. | නිරීක්ෂණ නිවැරදියි. |

**2.3 තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කිරීම හා පියවීම**

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| මුදල් රෙගුලාසි 371(5) ප්‍රකාරව ලබාගත් තත්කාර්ය අතුරු අග්‍රිම දින 10 ක් ඇතුළත නිරවුල් කළ යුතු වුවත්, අවස්ථා 09 කදී නිකුත් කර තිබුණ එකතුව රු.238,990 ක තත්කාර්ය අතුරු අග්‍රිම නිරවුල් කිරීමේදී දින 31 සිට දින 83 ක් දක්වා පරාසයක කාලයක් ප්‍රමාද කර තිබුණි. | මුදල් රෙගුලාසි 371 ප්‍රකාරව කටයුතු කළ යුතු අතර එම රෙගුලාසිවලට පටහැනිව කටයුතු කළ නිලධාරීන් වේ නම් ඔවුන් සම්බන්ධයෙන් ආයතන සංග්‍රහයේ XLVII පරිච්ඡේදයේ 8.1 හා 8.2 වගන්ති ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. | මේ වන විට සියලු නිලධාරීන් දැනුවත් කර ඉහත චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කරමින් පවතී. |

**2.4 තැන්පත් ශේෂයන්**

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| වර්ෂ 2 කට වැඩි කාලයක සිට නිරවුල් නොවී පැවැත එන එකතුව රු.7,488,595 ක තැන්පත් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. | මෙම රැඳවුම් මුදල නිදහස් කිරීම සඳහා කටයුතු කරමින් පවතී. |

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 කාර්යභාරයන් ඉටු නොකිරීම**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| දෙපාර්තමේන්තුවේ අභ්‍යන්තර සංවර්ධන ව්‍යාපෘති 10 ක් ක්‍රියාවට නැන්වීම සඳහා රු.මිලියන 81 ක් වූ ප්‍රතිපාදන සලසා ගෙන තිබුණත්, | මුදල් රෙගුලාසි 50 ප්‍රකාරව වූ විධිවිධානවලට අනුකූලව ඇස්තමේන්තු පිළියෙල කර ලබාදුන් ප්‍රතිපාදන උපයෝජනය | නැවත මිල කැඳවීමට සිදුවීම, සමහර ව්‍යාපෘති නතර කිරීම හෝ ක්‍රියාත්මක කිරීමට නොහැකි |

| | | |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් එම ව්‍යාපෘති ක්‍රියාත්මක කර නොතිබුණි. | කිරීමට හැකිවන පරිදි සැලැසුම් පිළියෙල කළ යුතු වීම. | වීම, ප්‍රසම්පාදන ලියකියවිලි සකස් කරගැනීමට වැඩි කාලයක් ගතවීම, තාක්ෂණ ඇගයීම් කමිටු කටයුතු සැලසුම් කළ කාලයට වඩා වැඩි කාලයක් ගතවීම වැනි හේතූන් නිසා මෙම කාර්යභාරයන් ඉටු කිරීමට නොහැකි වීම. |

## 3.2 ප්‍රසම්පාදනය

--------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) සමාලෝචිත වර්ෂයේදී දෙපාර්තමේන්තුව විසින් ප්‍රසම්පාදන ක්‍රියාවලිය මඟින් රු.මිලියන 131.22 ක සැපයීම් හා සේවා ඉටුකර ගැනීමට සැලැසුම් සකස් කර තිබුණි. නමුත් වර්ෂය තුළදී රු.මිලියන 26.6 ක් හෙවත් ඉටු කළ යුතු ප්‍රසම්පාදනවලින් සියයට 20 ක් පමණක් සිදුකර තිබුණි. සැලසුම් කළ බොහෝ ව්‍යාපෘති ආරම්භ නොකිරීම, මිල කැඳවීම් පමණක් සිදු කිරීම, නැවත මිල කැඳවීම් කිරීම, ටෙන්ඩර් ලියවිලි සකස් කිරීමට හා ඇගයීමට වැඩි කාලයක් ගත කිරීම වැනි හේතු මීට බලපා තිබුණි. | දෙපාර්තමේන්තුව විසින් මුදල් වර්ෂවල ප්‍රසම්පාදන සැලැස්මට ඇතුළත් කර ඇති ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම කෙරෙහි අවධානය යොමු කළ යුතුය. | 2018 ඔක්තෝබර් 15 දින වන විට රු.මිලියන 69.7 ක් වටිනා ව්‍යාපෘති පිළිබඳව අවසන් තීරණ/ ඇනවුම් ලබාදී ඇත. අදාළ භාණ්ඩ නියමිත කාලය තුළ සැපයීමට සැපයුම්කරුට නොහැකි විය. |
| (ආ) සමාලෝචිත වර්ෂයේ කිසිදු ප්‍රසම්පාදනයක් ක්‍රියාත්මක කාල රාමුව තුළ සිදුකර නොතිබුණ අතර පරීක්ෂා කරන ලද ඇස්තමේන්තුගත වටිනාකම රු.12,725,000 ක් වූ වත්කම් අත්පත් කර ගැනීමේ ප්‍රසම්පාදනයන් 07 ක් නිම කිරීම සැලැසුම් කළ දිනයට වඩා මාස 05 ක සිට 08 ක් දක්වා පරාසයක කාලයක් ප්‍රමාද කර තිබුණි. | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.11(අ) මාර්ගෝපදේශය ප්‍රකාරව ප්‍රසම්පාදන කාල සටහන අනුව ව්‍යාපෘති නිම කළ යුතුව ඇත. | තාක්ෂණ ඇගයීම් කමිටු සඳහා බාහිර ආයතන නිලධාරීන් සහභාගි කරගැනීමට සිදුවීම, පිරිවිතර සකස් කරගැනීමට වැඩි කාලයක් ගතවීම, මිල ගණන් ඇගයීමට වැඩි කාලයක් ගතවීම හේතුවෙන් ප්‍රමාදයන් සිදුවී ඇත. |

## 3.3 වත්කම් කළමනාකරණය

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | 2017 වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයේදී හඳුනාගත් භාවිතයෙන් ඉවත් කළයුතු වත්කම් අයිතම 350 ක් 2018 වර්ෂයේදී විනාශ කිරීමෙන් හා විකිණීමෙන් ඉවත් කර තිබුණ ද, වත්කම් ලේඛනවලින් හා ගිණුම් පොත්වලින් අදාළ වත්කම් ඉවත් කිරීමට විගණිත දිනය වූ 2019 මැයි 02 දින වන විටද කටයුතු කර නොතිබුණි. | විනාශ කළ හා විකුණූ වත්කම් මූලා ප්‍රකාශනවලින් හා වත්කම් ලේඛනවලින් ඉවත් කළ යුතුව ඇත. | 2018 වර්ෂයේදී ඉවත් කළ භාණ්ඩ වෙනුවෙන් 2018.12.11 වෙනි දින භාණ්ඩ වට්ටෝරු පොත්වලින් ඉවත්කිරීමේ නියෝග නිකුත් කිරීමට කටයුතු කර ඇත. |
| (ආ) | 2015 මාර්තු 25 දින පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ හා ජනමාධ්‍ය අමාත්‍යාංශය වෙත අනුයුක්ත කරන ලද 2011 වර්ෂයේදී කල්බදු ක්‍රමයට ලබාගත් ඩබල් කැබ් රථය 2019 මැයි 02 විගණිත දින වන විටත් නැවත දෙපාර්තමේන්තුව වෙත ලබාගෙන නොතිබුණි. එම රථය 2016 දෙසැම්බර් 26 දින අනතුරකට ලක්ව වසර 02 කට අධික කාලයක් භාවිතයෙන් තොරව ගාල්කර තිබුණි. | අදාළ රථය දෙපාර්තමේන්තුවට ලබා ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම. | මෙම රථය අලුත්වැඩියා කර භාර දෙන ලෙස ලිඛිතව දැනුම් දුන්නද මේ වන තෙක් ජනමාධ්‍ය අමාත්‍යාංශය විසින් එම රථය අලුත්වැඩියා කර දෙපාර්තමේන්තුව වෙත භාරදී නොමැත. |
| (ඇ) | දෙපාර්තමේන්තුවේ සංචිත වාහන 19 කින් ධාවන තත්ත්වයේ නොමැති වාහන 03 ක් වසර දෙකකට වැඩි කාලයක් අලුත්වැඩියා කිරීමට හෝ ඉවත් කිරීමට හෝ කටයුතු නොකර දෙපාර්තමේන්තු පරිශ්‍රයේ ගාල්කර තිබුණි. | වාහන 03 අලුත්වැඩියා කිරීමට කටයුතු කිරීම හෝ එසේ නොහැකි නම් විධිමත් පරිදි අපහරණය කිරීම. | මේ වන විට භාවිතයෙන් ඉවත් කර ඇති වාහන 02 ක් පමණක් පවතී. එම වාහන 02 2019.06.07 දින වෙන්දේසි මඟින් විකිණීමට පුවත්පත් දැන්වීම් පල කර ඇත. |

**3.4** **පාඩු හා හානි**

**---------------**

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | 2017 වර්ෂයේ සිදු වූ වාහන අනතුරු 03 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 103(1) ප්‍රකාරව පරීක්ෂණ පවත්වා වගකිව යුත්තන් නිශ්චය කර අලාභයට වගකිව යුතු නිලධාරීන් විසින් ඒ සඳහා ගෙවිය යුතු මුදල් ප්‍රමාණය නිශ්චය කර එම මුදල් පූරණය කරන ලෙස ඔවුන්ට නියම කර අයකර ගැනීමට ක්‍රියා කර නොතිබුණි. එමෙන්ම උචිත අවස්ථාවලදී බැංකුව, රක්ෂණ සමාගම්, ඇප සහතිකකරුවන් වෙත හිමිකම් පෑම් ඉදිරිපත් කර අලාභ අයකර ගැනීම, විගණිත දින වූ 2019 මැයි 02 දින වන විටත් සිදුකර නොතිබුණි. | වාහන අනතුරු සම්බන්ධව මු.රෙ.103(1) (ඇ), (ඊ), (එ), 104 හා 109 ප්‍රකාරව කටයුතු කර පාඩු හා අලාභ අයකර ගැනීමට කටයුතු කළ යුතුය. | අදාළ පාඩු හා හානි සම්බන්ධයෙන් පරීක්ෂණ කටයුතු සිදු කෙරෙමින් පවතී. |
| (ආ) | හිටපු අධ්‍යක්ෂ ජනරාල්වරයෙකුට නිකුත් කරන ලද ජංගම දුරකථනය හා උකුල් පරිගණකය විගණන දිනය වූ 2019 මැයි 02 දින වන විටත් ආපසු භාරදී නොතිබුණ අතර, ඒවා 2014 හා 2015 වර්ෂවල භාණ්ඩ සමීක්ෂණ වාර්තාවල ඌනතාවයන් ලෙස දක්වා තිබුණි. සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් එම ඌනතාවයන් සඳහා වර්ෂ 04 කට වැඩි කාලයක් ගතවී තිබුණත්, ඒ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 156(1) ප්‍රකාරව සුදුසු ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | මුදල් රෙගුලාසි 156 (1) (ආ) ප්‍රකාරව කටයුතු කළ යුතුවීම. | අදාළ උපකරණ දෙපාර්තමේන්තුව වෙත භාරදෙන ලෙස නිලධාරියාට ලිඛිතව දන්වා ඇති අතර, භාණ්ඩ ආපසු ලබා ගැනීමට කටයුතු සිදුකෙරෙමින් පවතී. |

## 3.5 කළමනාකරණ දුර්වලතා

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| සේවය අතහැර ගිය නිලධාරීන් දෙදෙනකුගෙන් අයකර ගතයුතු වර්ෂ 17 කට වඩා පැරණි රු.195,040 ක ණය ශේෂ විගණිත දිනය වූ 2019 මැයි 02 දින වන විටද අයකර ගැනීමට දෙපාර්තමේන්තුව අපොහොසත්වී තිබුණි. | ආයතන සංග්‍රහයේ XXIV පරිච්ඡේදයේ 4 වගන්තියේ සඳහන් විධිවිධාන අනුගමනය කළ යුතුය. | හිඟ ණය ශේෂ අයකර ගැනීම සම්බන්ධයෙන් කටයුතු කිරීම සඳහා නීතිපති දෙපාර්තමේන්තුව වෙත යොමු කර ඇති අතර, අදාළ උපදෙස් ලැබීමෙන් පසු ඉතිරි ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කරන බව දන්වමි. |

## 4. යහ පාලනය

### 4.1 අභ්‍යන්තර විගණනය

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 40(1) වගන්තිය හා මුදල් රෙගුලාසි 133 ප්‍රකාරව දෙපාර්තමේන්තුව සඳහා අභ්‍යන්තර විගණකවරයෙකු සිටිය යුතු වුවද, 2019 මැයි 30 දින වන විටත් දෙපාර්තමේන්තුව සඳහා අභ්‍යන්තර විගණකවරයෙකු පත් කර නොතිබුණි. | 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 40(1) වගන්තිය හා මුදල් රෙගුලාසි 133 ප්‍රකාරව අභ්‍යන්තර විගණන ඒකකයක් ස්ථාපිත කළ යුතුව ඇත. | නිරීක්ෂණය නිවැරදිය. දැනට පුරප්පාඩුව පවතින අභ්‍යන්තර විගණන තනතුරට නිලධාරියකු පත්කරන මෙන් දන්වා ඇතත් මෙතෙක් පත්කිරීම් බලධාරියා විසින් පත්කිරීම් සිදුකර නැත. |

## 5. මානව සම්පත් කළමනාකරණය

මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| (අ) 2018 දෙසැම්බර් 31 දිනට දෙපාර්තමේන්තුවේ 344 ක් වූ අනුමත කාර්ය | අනුමත බඳවා ගැනීමේ පරිපාටියට අනුව පුරප්පාඩු පිරවීම හෝ අතිරික්ත | නිරීක්ෂණය නිවැරදිය. |

| | | | |
|---|---|---|---|
| | මණ්ඩලයෙන් තනතුරු 109 ක් පුරප්පාඩුව පැවතුණි. | තනතුරු වේ නම් භාණ්ඩාගාරයෙන් විමසා කටයුතු කිරීම. | |
| (ආ) | දෙපාර්තමේන්තුවේ කාර්යභාරය ඉටු කිරීම සඳහා ඉතා අවශ්‍ය තෘතීයික මට්ටමේ අනුමත කාර්ය මණ්ඩල තනතුරු 16 කින් තනතුරු 14 ක් 2018 දෙසැම්බර් 31 දිනට පුරප්පාඩුව පැවතුණි. වාර්ෂික අයවැය ඇස්තමේන්තුව අනුව ජනතාව දැනුවත් කිරීමේ වැඩසටහන් (Enterprise Sri Lanka) සඳහා රු.මිලියන 231.5 ක ප්‍රතිපාදන සලසා ගෙන තිබුණත්, එම වැඩසටහන මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශය ලවා ඉටුකරගෙන තිබුණි. | අනුමත බඳවා ගැනීමේ පරිපාටියට අනුව පුරප්පාඩු පිරවීම හෝ අතිරික්ත තනතුරු වේ නම් භාණ්ඩාගාරයෙන් විමසා කටයුතු කිරීම. | නිරීක්ෂණය නිවැරදිය.<br><br>භාෂා පරිවර්තක සේවයේ සහ අනෙකුත් ඒකාබද්ධ සේවාවන්වල පුරප්පාඩු සඳහා නිලධාරීන් පත්කර එවන මෙන් දන්වා ඇතත් පත්වීම් සිදුකර නොමැත. අනෙකුත් දෙපාර්තමේන්තුගත තනතුරු සඳහා නිලධාරීන් බඳවාගැනීමට, බඳවා ගැනීම් පටිපාටියට අනුව අයදුම්පත් කැඳවීමේ නිවේදනය, සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය හා ලකුණු පටිපාටිය රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත යැවූවද විවිධ හේතූන් මත අනුමත කිරීමට කල්ගත වී ඇත. ජ්‍යෙෂ්ඨ ප්‍රවෘත්ති නිලධාරී තනතුරු පුරප්පාඩු පිරවීම දැනට සේවය කරන නිලධාරීන්ගේ ශ්‍රේණි උසස් කිරීමේ ක්‍රමයක් මත සිදු වන්නක් වන අතර ඒ සඳහා සුදුසුකම් සම්පූර්ණ කරන ලද නිලධාරීන් නොමැති හෙයින් දැනට පවතින බඳවා ගැනීම් පටිපාටිය සංශෝධනය කළයුතු බැවින් ඒ සඳහා කටයුතු කෙරෙමින් පවතී. |